## කොළඹ විශ්ව විද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2018/2019

## පළමු සෙමෙස්තර වාර අවසාන

## ECN 2120: මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ආර්ථික විද්‍යාව

**කාලය - පැය දෙකයි (02)**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

---

1) මානව සම්පත් කළමනාකරණය, සංවිධානයක සාර්ථකත්වයට දායක වන්නේ කෙසේ ද යන්න මානව සම්පත් කළමනාකරණ ආකෘතියක් (HRM Model) අනුසාරයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 25)

2)

I). "මානව ප්‍රාග්ධන සම්පාදනය, මානවයා වෙනුවෙන් ආයෝජන කිරීම හා ඔහු/ඇය නිර්මාණාත්මක හා ඵලදායී සම්පතක් ලෙස සංවර්ධනය කිරීමට අදාළ වේ". ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 13)

II). ශ්‍රී ලංකාවේ මානව ප්‍රාග්ධනය සම්පාදනය සඳහා පවතින අභියෝග මොනවා ද?

(ලකුණු 12)

3) "පුරෝකථනය කරන ලද මානව සම්පත් ඉල්ලුම තක්සේරු කරන ලද මානව සම්පත් සැපයුම සමඟ සැසඳීමෙන් පසුව ගත යුතු අවශ්‍ය උපක්‍රම නිශ්චය කල යුතු ය" මෙම ප්‍රකාශයේ වලංගුභාවය විභාග කරන්න.

(ලකුණු 25)

4)

I). "ආකර්ෂණය (Recruitment) සඳහා බලපාන සාධක පිළිබඳ ව සාර්ථක මානව සම්පත් කළමනාකරුවෙකු සංවේදී විය යුත්තේ ඒවා සේවකයන් ආකර්ෂණය කර ගැනීමේ දී බාධාවන් (Constraints) විය හැකි බැවිනි" සාකච්ඡා කරන්න. (ලකුණු 13)

II). පහත දැක්වෙන ඕනෑම ආකර්ෂණ (Recruitment) ක්‍රම <u>දෙක (02) ක්</u> තෝරා ගෙන ඒ එක් එක් ක්‍රමයේ වාසි සහ අවාසි විස්තර කරන්න. (ලකුණු 6 බැගින්)

- i.) කුසලතා ඉන්වෙන්ටරි හා කළමනාකරණ ඉන්වෙන්ටරි (Skill Inventories & Management inventories)
- ii.) ප්‍රචාරණය (Advertising)
- iii.) සේවාදායක යොමු කිරීම (Employee Referrals)
- iv.) අධ්‍යාපනික ආයතන (Educational Institutions)

5) අලෙවිකරණ කළමනාකරු තනතුරු සඳහා රැකියා අයදුම්කරුවන් තිදෙනෙකු තෝරාගැනීමට ඔබ විසින් සේවා නියුක්ති සම්මුඛ පරීක්ෂණයක් පැවැත්විය යුතු බැව් උපකල්පනය කරන්න මේ සම්බන්ධයෙන් ඔබ ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි ලෙස විස්තර කරන්න.

(ලකුණු 25)

6) I). පුළුල් අනුස්ථාපන වැඩ සටහනකින් සංවිධානයකට හා එහි සේවකයන්ට ඇති වන ප්‍රතිලාභ මොනවා ද? (ලකුණු 15)

II). "නවක සේවකයන් අනුස්ථාපනය කිරීමේ දී බඩී ක්‍රමය (Buddy system) අනුගමනය කරන සංවිධානයක් විසින් එය විධිමත් අනුස්ථාපනයක් ආකාරයෙන් සිදු කිරීමට අවශ්‍ය නොවේ". ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 10)

7) පහත දැක්වෙන සංකල්ප යුගල අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 6.25 බැගින්)

I). රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය.
II). අභ්‍යන්තර බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා බාහිර බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය.
III). අයදුම්පත් ඇගයීම සහ ඇගයීම් මධ්‍යස්ථාන.
IV). රැකියා නිර්මාණයෙහි කාර්යක්ෂමතා මූලිකාංග සහ චර්යා මූලිකාංග.